# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 590/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/04/2024<br>පැය 1830 |

## මාධ්‍ය නිවේදනය

**සිංහල දෙමළ අලුත් අවුරුදු පොළ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේදී පැවැත්වීම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

සිංහල හා දෙමළ අවුරුදු උත්සවය නිමිති කරගෙන පොලිස් සේවා වනිතා ඒකකය සහ පොලිස් මූලස්ථාන සේවා වනිතා උප ඒකකය මඟින් සංවිධානය කරනු ලැබූ අවුරුදු පොළ 2024.04.05 වන අද දින සහ 2024.04.06 වන හෙට දින රාත්‍රී 09.00 දක්වා බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථාන පරිශ්‍රයේදී පවත්වනු ලබයි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහ එම මැතිණිය වන පොලිස් සේවා වනිතා ඒකකයේ සභාපති අනුරාධා විජේවර්ධන මහත්මිය 2024.04.05 වන අද දින උදෑසන කාලයේදී මෙම අවුරුදු පොළ නිරීක්ෂණය කිරීම සඳහා සහභාගී විය.

පොලිස් පර්යේෂණ හා තොරතුරු තාක්ෂණ දිසාව භාර කාන්තා නියෝජ්‍ය පොලිස්පති නිශානි සෙනෙවිරත්න මහත්මිය විසින් මෙම අවස්ථාවට පැමිණි පොලිස්පතිතුමා පිළිගන්නා ලදී. මෙම අවුරුදු පොළ සාර්ථකව සංවිධානය කිරීම සම්බන්ධයෙන් සහය දුන් සියළු දෙනාට පොලිස්පතිතුමා විසින් ප්‍රශංසාව සහ ස්තුතිය පිරිනමන ලදී.

මෙම අවස්ථාවට බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා, පොලිස් සේවා වනිතා ඒකකයේ නිලධාරිනියන් ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක්ද සහභාගි විය.

ඡායාරූප කිහිපයක්


STOCK CLEARANCE SALE
50% OFF


Turbo - Classic
Turbo - Premium
Turbo - Winter
CEYLON


SALE
1000/=
1100/=
1250/=
SCHOOL BAGS


POLICE








**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**